ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

CEYLON GOVERNMENT GAZETTE No. 6,866 — APRIL 12, 1917.

# SINHALESE TRANSLATIONS OF NOTIFICATIONS.

[By-laws made by the Local Board of Nawalapitiya relating to Dairies.]

"වර්ෂ 1898වේ ලෝකල් බෝඩ් ආඥාපණත."

වර්ෂ 1898වේ ලෝකල් බෝඩ් ආඥාපණතේ 56වෙනි වගන්තිය යටතේ නාවලපිටියේ ලෝකල් බෝඩ් සභාව විසින් සාදනලද මෙහි පහත සඳහන් අතුරුපණත් කාරක මන්ත්‍රිසභාවේ සම්මතය ඇතුව ගරුතර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලදින් මෙසින් ප්‍රසිඩකරන්ට යෙදුනා ඇත.

ගරුතර උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 4වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

———

ආර්. ඊ. ස්ටබ්ස්,
මහ සෙක්‍රතාරිස් වම්හ.

අතුරුපණත්.

1. ලෝකල් බෝඩ් සභාවේ මායිම් තුළ කිරි විකුණන අය යනොකතා සභාවේ කන්තෝරුවේ ඔවුන්ගේ නම්ද කිරි දෙවින ස්ථානද ලියාපදිංචිකරන්ට ඕනෑය.

2. වැසිකිළියකට හෝ කක්කුස්සියකට අඩි 50ක් ඇතුළත නොහොත් ඒවායින් දුර්ගන්ධය පැමිණිය හැකි ස්ථානයක කිරි දෙවීමට ඉඩදෙනු නොලැබේ.

3. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට ඒත්තුගනාකාරයට සියලුම කිරි දෙවින ස්ථානවල වතුර බැසයාම පිණිස සෑහෙණ පමණ කානු තබන්ට ඕනෑය. එම කානු සුබපවිත්‍රව තබන්ට ඕනෑවා සහ එම ස්ථානයේ නරක වතුර නවතින්ට ඉඩනොහැරිය යුතුයි.

4. කිරි දෙවින ස්ථානයක් සම්බන්ධවූ සියලුම හරක් ගාල් පිරිසිදුව හොඳකාර අළුත්වැඩියාකර තිබියයුතුයි. එහි බිම සෝදන්ට පුළුවන් කලක් පවතින සවි ඇති ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුයි.

5. කිරි දෙවින ස්ථානයේ කුනුකසල ආදිය අප්‍රමාදව ඉවත්කරන්ට ඕනෑවා සහ සෑමදම ගොම එම ස්ථානයෙන් ඉවත් කරන්ට ඕනෑය.

6. පිරිසිදු වතුර ගන්න ස්ථානයක් පහසු දුරින් පිහිටුවා තිබෙන්ට ඕනෑය. කිරිදෙවින ස්ථානයක තිබෙන ළිඳක නෑමද රෙදි සේදීමද තහනම්ය. නෑමට සහ රෙදි සේදීමටත් පාවිච්චිකරන්නාවූ කිරිදෙවින ස්ථානයට පිටතින් තිබෙන ළිඳකින් කිරිදෙවින ස්ථානයේ පාවිච්චියට වුවමනා වතුරගන්ට බැරිය.

7. කිරිදෙවීම පිණිස පාවිච්චිකරන ගොඩනැගිල්ල මිනිසුන්ගේ පදිංචියට නොහොත් වෙනයම් කටයුත්තකටවත් පාවිච්චිකරන්ට බැරිය. එම ස්ථානය සියලු කල්හිම ශුඩපවිත්‍රව තබන්ට ඕනෑය.

8. කිරිගන්න එළදෙන්නු යම්කිසි රෝගයක් නොමැතිවූ දෙන්නු වියයුතුයි. කිරිදෙවින උදවිය හොරි කුෂ්ඨ ආදී රෝගවලින්ද, බෝවෙන රෝගවලින්ද, වසංගත රෝගවලින්ද වැලකී සිටිය යුතුයි. කිරිවලට වතුර හෝ අන්‍ය දියර හෝ වෙන දෙයක් මිශ්‍ර නොකළ යුතුයි.

9. කිරිදෙවින ස්ථානයේ පාවිච්චිකරන්නාවූ නොහොත් ඒ ස්ථානයට අයිතිව තිබෙන්නාවූ සියලුම භාජන සහ ආම්පන්න ආදිය පිරිසිදුව තිබෙන්ට ඕනෑය.

10. කිරි විකිනීමට ගෙනයන සියලුම භාජන හොඳට වසලා නොහොත් ඇබගසා තිබෙන්ට ඕනෑය. තවද එකී භාජන කිහිල්ලේ යට තබාගන නොයෑ යුතුයි.

11. ඒජන්ත උන්නාන්සේගෙන් බලයක් නැතුව කිසි කෙනෙක් විසින් කිරි සැපයීම, විකිනීම, විකිනීම පිණිස ගෙන යාම හෝ විකිනීමට තැබීම තහනම්ය. තවද ඉහතකී යම් කිසිවෙකුට බලයදීමට මත්තෙන් එවැනි අය දොස්තර කෙනෙක් විසින් විභාගකිරීම සෑහේය කියා ඒජන්ත උන්නාන්සේට කල්පනාවේනම් එසේ කියමකළ හැකිය. එවැනි සියලුම කිරි වෙළෙන්දෝ කිරි විකිනීමට යනවිට සෑමවේලේම පිරිසිදු වස්ත්‍ර ඇඳ ඔවුන්ගේ අවසරපත්‍ර රැගෙන යායුතුය. මේ අතුරුපණත යටතේ දෙනලද අවසරපත්‍රයට ගාස්තුවක් අයකරනු නොලැබේ.

12. කිරිසපයන, විකුනන, විකිනීමට අරන් යන නොහොත් විකිනීමට තබාගන සිටින යම් කෙනෙකුගෙන් හෝ රෙජිස්ටර් කලාවූ කිරි විකුනන ස්ථානයකින් කොයිම වේලාවකවුවත්, ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට, ආණ්ඩුවේ දොස්තර තැනට, ලෝකල්බෝඩ් සෙක්‍රතාරිස් තැනට හෝ පරීක්ෂකතැනට නොහොත් ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලක් පිට බලයලත් කොයිම කෙනෙකුට නුමුත් පරීක්ෂණය පිණිස කිරි ගතහැකිය. තවද කිරි විකුනන, විකිනීමට අරන් යන, විකිනීමට තබාගන සිටින සියලුම අයවළුන් විසින් සහ සියලුම කිරි දෙවින ස්ථාන අයිතිකාරයින් විසින් ඉහත සඳහන් කළ නිලධාරීන්ටද විශෙෂයෙන් පත්කර සිටින අයවලුන්ටද එකී පරීක්ෂණය පිණිස කිරි ගැනීමට ඉඩදිය යුතුය.

# LAND SALES.

## ඉඩම් විකිණීම්.

**No. 3,253, W. P.**—බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1917ක්වූ මැයි මස 11වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර දිසාවේ කොළඹ පලාතේ හේවාගම් සහ නැගෙණහිර සියනෑකෝරලවල පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

සිතියම 16,112. ගම—හේවාගම්කෝරලේ මැදපත්තුවේ, අන්ගන්පිටිය. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ගොලලන්දේවත්ත | ඩබ්ලිව්. පොඩිනෝනා | අල්ලාගෙන තිබෙන කැල්ල | 1 | 2 | 22 |
| | සිතියම 15,524. | ගම—හේවාගම්කෝරලේ මැදපත්තුවේ, අන්ගොමුව. | | | | |
| 5621 | මහකුඹුරලන්ද | ඇම්. දොන් යගෝනිස් ජයවර්‍ධන | අල්ලාගෙන තිබෙන කැල්ල. | 0 | 0 | 37 |
| | සිතියම 16,072. | ගම—හේවාගම්කෝරලේ මැදපත්තුවේ, අරුක්වත්ත. | | | | |
| 2 | මදිපියගහලන්ද | එච්. ගවෝනිස්අප්පු | අල්ලාගෙන තිබෙන කැල්ල | 0 | 1 | 14 |
| | සිතියම 16,191. | ගම—හේවාගම්කෝරලේ මැදපත්තුවේ, දුම්පේ. | | | | |
| 1 | බටලන්ද, | එච්. අල්ලිස්අප්පු | අල්ලාගෙන තිබෙන කැල්ල | 1 | 1 | 26 |
| 2 | එම | එම | එම | 0 | 1 | 16 |
| 4 | හල්ලින්දවත්ත | ආර්. බබ්බුඅප්පු | එම | 1 | 3 | 28 |
| 8 | එම | කේ. බ්‍රම්පිසිංඤෝ | එම | 0 | 3 | 38 |
| 9 | එම | ඩබ්ලිව්. අන්ද්‍රිස්නයිදෙ සහ වී. ජේම්ස් | එම | 3 | 1 | 18 |
| | සිතියම 55. | ගම—නැගෙණහිර සියනෑකෝරලේ ගඟබොඩපත්තුවේ, හිස්සැල්ල. | | | | |
| 3 | කුඹුම්බිකන්ද නොහොත් අල බලන්කන්ද | ඇම්. නොන්චි | අල්ලාගෙන තිබෙන කැල්ල | 1 | 1 | 11 |
| | සිතියම 15,393. | ගම—හේවාගම්කෝරලේ මැදපත්තුවේ, හොරගල. | | | | |
| Y 38 | පන්සලවත්ත | විමලතිස්ස තෙරුන්නාන්සේ | අල්ලාගෙන තිබෙන කැල්ල | 0 | 2 | 0 |
| | සිතියම 15,277. | ගම—හේවාගම්කෝරලේ උඩුගහපත්තුවේ, කොස්ගම. | | | | |
| 4732 | බෙරගලලන්ද | එ. ආරොන් | අල්ලාගෙන තිබෙන කැල්ල | 0 | 2 | 23 |
| | සිතියම 15,802. | හේවාගම්කෝරලේ උඩුගහපත්තුවේ මාබුල. | | | | |
| 6477 | බල්ලාමලලන්දේවත්ත | වී. සිඤ්ඤෝඅප්පු | අල්ලාගෙන තිබෙන කැල්ල | 2 | 1 | 24 |
| | සිතියම 15,483. | හේවාගම්කෝරලේ මැදපත්තුවේ මලගල. | | | | |
| 5540 | වැලිපොතවත්ත | එච්. අල්ලිස්අප්පු | අල්ලාගෙන තිබෙන කැල්ල | 0 | 2 | 9 |
| 5533 | වැලිපොතලන්ද | ඇම්. කරෝලිස්පෙරේරා | එම | 0 | 1 | 33 |
| 5532 | වැලිපොතවත්ත | එම | එම | 0 | 0 | 38 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ බස්නාහිර දිසාවේ ඒජන්තඋන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් ආදිය ගැන සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1917ක්වූ අප්‍රේල් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තැනිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ.

---

**No. 3,022, S. P.**—දකුණු දිසාවේ මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1917ක්වූ මැයි මස 12වෙනි දිනවූ සෙනසුරාදා උදේ 10ට මාතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර පලාතේ මොරවක්කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

සිතියම 170. ගම—පල්ලේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයාගේ නම. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 161*bk* | පරගලහේන | මුහන්දිරම් රත්නායක | බැද්ද | 3 | 0 | 3 | 40 |
| 161*bk*1 | එම | එම | එම | 4 | 0 | 25 | 40 |

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ මාතර උපඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1917ක්වූ අප්‍රේල් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තැනිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තැනිස් වම්හ.

---

**No. 3,023, S. P.**—දකුණු දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1917ක්වූ ජූනි මස 12වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ ගඟබඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 16ක්.

සිතියම 10,126. ගම—අටපේජම. අයිතිකමකියන්නා—අටපේගම සූරියආරච්චි එරෝලිස්.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4656 | ඌරමලහේනවත්ත | ඇස්. එරෝලිස් | වත්ත | 0 | 0 | 23 | 100 |
| | සිතියම 10,451. | ගම—හත්තත්වෙල. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | |
| 1 | කොහොන්ගොඩ වත්ත අද්දර දෙනිය | ඇල්. සාදිරිස් | සුළු බැද්ද | 0 | 2 | 27 | 50 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | සිතියම 10,509. ගම—බද්දේගම නැගෙනහිර. | | | | | | |
| 1 | පැලැස්සකැටියකන්ද .. | — .. | .. බැද්ද (විකුණන්නේ නැහැ) | 0 | 1 | 1 | —* |
| 2 | එම .. | එච්. සී. විජේසිංහ .. | .. බැද්ද .. | 2 | 3 | 26 | 65 |
| 3 | එම .. | — .. | .. එම .. | 0 | 3 | 25 | 65 |
| | අයිතිකමකියන්නා—පල්ලාවලගේ ජුවන්ගේ උරුමක්කාරයෝ. | | | | | | |
| 4 | එම .. | — .. | .. වත්ත .. | 0 | 3 | 23 | 60 |
| | සිතියම 10,510. ගම—ඉහල ලේල්වල. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 1 | හැලඹගහබිට .. | — .. | .. මඩඉඩම ... | 0 | 0 | 8 | 45† |
| | අයිතිකමකියන්නා—ගාල්ලේ ඇජ්. ඒ. වික්‍රමසිංහ. | | | | | | |
| 2 | පින්සියේවිලගොඩකන්ද .. | — ... | .. ගේ ඉඩම .. | 0 | 0 | 25 | 45† |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 3 | දෙලේහේන නොහොත් පින්සියේ විලගොඩකන්ද .. | අක්මීමන පදිංචි ඇම්. බී. සිරිවර්ධන .. | බැද්ද .. | 0 | 2 | 7 | 50 |
| 4 | එම .. | — .. | .. බැද්ද සහ අඩිපාර (විකුණන්නේ නැහැ) .. | 0 | 1 | 9 | —* |
| 5 | එම .. | ඇම්. බී. සිරිවර්ධන .. | බැද්ද .. | 1 | 1 | 5 | 50 |
| | සිතියම 10,564. ගම—ගම්මැද්දෙගොඩ. | | | | | | |
| 1 | කන්දූල්ලපුවබැද්ද .. | ඇල්පිටියේ තලගස්වෙල්ලේ පදිංචි ඇම්. දූනියෙල් .. | .. බැද්ද ... | 0 | 3 | 38 | 40 |
| | සිතියම 10,569. ගම—මාබොටුවන. | | | | | | |
| 1 | උල්ගලහේනේදෙනිය ... | ඌරල පදිංචි ජේ. ඒබ්‍රහම් .. | සුළු බැද්ද .. | 0 | 3 | 2 | 45 |
| | සිතියම 10,570. | | | | | | |
| 1 | කජුගස්වත්ත .. | මාබොටුවන පදිංචි එච්. ජී. දියෝනිස් ද සිල්වා .. | .. එම .. | 1 | 0 | 14 | 40 |
| | සිතියම 10,576. ගම—අගලිය. | | | | | | |
| 1 | උඩවේගොඩකන්ද .. | ඒ. බී. ඒ. ගුණවර්ධන ... | බැද්ද .. .. | 1 | 1 | 27 | 45 |
| | සිතියම 10,582. ගම—ඉහල ලේල්වල. | | | | | | |
| 1 | හින්දපොත්දෙනියේකන්ද .. | ලේල්වල පදිංචි එස්. ජේ. එගෝඩිලිස් | මහ බැද්ද .. | 0 | 2 | 12 | 45 |
| 2 | එම .. | — ... | .. මහ බැද්ද (විකුණන්නේ නැහැ) .. | 0 | 0 | 12 | —* |
| 3 | එම .. | — .. | ... බැද්ද (විකුණන්නේ නැහැ) | 0 | 0 | 16 | —* |
| | සිතියම 10,592. ගම—පාත වැලිවිටිය. | | | | | | |
| 1 | අඳපාගොඩ කන්ද අද්දර කොරටුව .. | බන්බාරිගොඩගේ සින්නිඅප්පු .. | බැද්ද .. .. | 1 | 0 | 5 | 45 |
| | සිතියම 10,598. ගම—කැප්පිටියගොඩ. | | | | | | |
| 1 | කරන්නවිගොඩබැද්ද .. | කැප්පිටියා ගොඩ පදිංචි එච්. යාන් දේරිස් .. | .. බැද්ද ... .. | 1 | 0 | 15 | 50 |

* තහනම් ඉඩම්. † මිනිරන් හෑරීමේ බලය ඇතුව රුපියල් 150.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු, ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 11වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය

ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වම්හ.

---

No. 3,024, S. P.—දකුණු දිසාවේ මහාඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1917ක්වූ ජූනි මස 26වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරදෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරලේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 10ක්.

සිතියම 9,544. ගම—පොල්අතුපලාත. අයිතිකමකියන්නා—ඩබ්ලිව්. පොඩිසිඤ්ඤෝ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. | රූ. | ප. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2540 | පොල්අතුකන්දේමහවෙල .. | — | .. කුඹුර .. | 0 | 0 | 8 | 150 |
| | සිතියම 9,794. ගම—අඹුගොඩ. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 3485 | මහහේනේකුඹුර නොහොත් ඉඹුල්පිටියේකුඹුර .. | — | .. කුඹුර .. | 0 | 0 | 29 | 100 |
| | සිතියම 9,962. ගම—බඹරවාන. | | | | | | |
| 4078 | කපුරුවත්තේපොල්ලැව්ව .. | අම්බලංගොඩ අන්ද්‍රවාස් පට බැදිඉරිනේලිස් ද වාස් .. | බැද්ද .. | 2 | 3 | 21 | 70 |
| | සිතියම 10,162. ගම—මාගල උතුර. අයිතිකමකියන්නා—මාගල උතුරේ සෙන්දියා සහ හකුරුදසනේරිස්. | | | | | | |
| 4764 | කජුගහවත්ත .. | — | .. වත්ත .. | 1 | 2 | 34 | 60 |
| 4764½ | එම .. | — | .. එම .. | 0 | 1 | 21 | 60 |
| | සිතියම 10,538. ගම—තල්ගස්පේ. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | | |
| 1 | ගල්කඩුල්ලේහේන .. | බලපිටියේ පදිංචි ඇම්. සෙනේරිස් ද සිල්වා .. | හේන .. | 1 | 2 | 21 | 75 |
| 2 | එම .. | — | .. හේන (විකුණන්නේ නැහැ) | 0 | 2 | 2 | —* |
| 3 | එම .. | — | .. එම .. | — | | | —† |
| 4 | ගල්කඩුල්ලේදෙනිය .. | — | .. දෙනිය (විකුණන්නේ නැහැ) | 0 | 0 | 10 | —* |
| 5 | ගල්කඩුල්ලේහේන .. | — | .. රබර් (විකුණන්නේ නැහැ) | — | | | —† |
| 6 | ගල්කඩුල්ලේදෙනිය .. | — | .. දෙනිය .. | 1 | 1 | 25 | 75 |
| 7 | එම .. | — | .. දෙනිය (විකුණන්නේ නැහැ) | 0 | 0 | 13 | —* |
| 8 | එම .. | — | .. දෙනිය (විකුණන්නේ නැහැ) | — | | | —† |
| 9 | එම .. | බලපිටියේ මුනසිංහ සෙනේරිස් සිල්වා .. | දෙනිය .. | 0 | 1 | 26 | 75 |

* තහනම් ඉඩම්. † ආණ්ඩුව අයිතිකම් නොකියන ඉඩම්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|
| | | සිතියම 10,552. ගම—මාගල උතුරේ. | | | |
| 1 | කොරකීනකැලේ .. | බෙන්තොට පදිංචි ආර්. ඇජ්. ඩයස් බන්ඩාරනායක .. | බැද්ද .. | 9 3 2 | 50 |
| 2 | එම .. | — .. | එම (විකුනන්නේ නැහැ) .. | 0 0 17 | —* |
| | | සිතියම 10,574. ගම—ගෝනගල. | | | |
| 1 | බඩුල්ලගහකන්ද .. | පී. ඕ. බ්බාසිංඤෝ .. | බැද්ද .. | 2 1 32 | 65 |
| 2 | එම .. | — .. | බැද්ද (විකුනන්නේ නැහැ) | — | —† |

* තහනම් ඉඩම්. † ආණ්ඩුව අයිතිකම් නොකියන ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර්ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 11වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්ශ.

---

**No. 1,217, P of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් වෙන්දේසිකිරීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1917ක්වූ මැයි මස 30වෙනි දිනවූ බදාදා දවල් 12ට බදුළු කච්චේරියේදී බදුදීමට වෙන්දේසිකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ උඩුකිඳ කොට්ඨාසයේ පිහිටා තිබෙන කට්ටිකැබලි 2ක්.

සිතියම 1,923. ගම—උඩුකිඳ යටිපලාතකෝරළේ මැදවෙල. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බෙරගොඩපතන .. | එච්. ජුවන් අප්පුහාමි ... .. .. | පතන ... | 11 1 15 |
| 2 | එම .. | එම .. .. .. | එම .. | 7 1 8 |

බදුදීමේ කොන්දේසි.

(1) තක්සේරු මුදල වන රුපියල් 71ක "පිරිමියම්" මෙන් ලාබ මුදල පිට, අවුරුද්දකට අක්කරයකට රුපියල් 2ක ගණනේ ඉඩම පනස් අවුරුද්දකට බදුදෙනුලැබේ.

(2) ඉඩම එලවළු වැවීමට පමණක් දෙනුලැබේ.

(3) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(4) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රාජසන්තකය කියා පලකරනුලැබේ.

(5) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය පිට ගොඩනගනලද ගෙයක හෝ ගෙවල්වල දැව ආදිය බද්ද ඉවරවුනාවිට බදුකාරයාට අහක්කරගන්ට පුළුවනි. එසේ බද්ද ඉවරවුණපු එහි තිබෙන ගොඩනැගිලිවල දැව ආදියේ වටිනාකම බදුකාරයාට ගෙවා එම ගෙවල් ආදිය එහි ඉතිරිකර ගැනීමට බදුදුන් අයට කැමැතිනම් එසේ කරන්ට පුළුවනි.

(6) බද්ද ඉවරවූවිට ඉඩමේ පලතුරුවල වටිනාකම් ගෙවන්නේ නැත.

(7) බදු කාලය ඇතුලතදීත් තක්සේරුකරනවිට බදු මුදල වෙනස්නොවේ.

(8) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියම්නතින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කිරීමටවත්, බාරදීමට හෝ ලියා දීමටවත්, ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක්නැත.

(9) ඉඩම් බදුදීමට වෙන්දේසි කරනවිට ඒවා සැම දෙනාටම වැඩිය ඉල්ලන අයට නොදීසිටීමේ බලය ඒ ගැණ යම් ප්‍රශනයක් නැතුව ආණ්ඩුවට පවරාගනුලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරනා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්ශ.

---

**No. 963, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුව විසින් නියමකරනලද විශෙෂ ගනන්වලට වර්ෂ 1917ක්වූ මැයි මස 22වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 10 රත්නපුරේ කච්චේරියේදී එම ඉඩම්වලට උරුමකියන අයවළුන් වෙනම විකුණන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 18ක්.

සිතියම 2,429/195. ගම—අකරැල්ල, මැදකෝරලේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| W 32 | අකරැල්ලවත්ත .. | සීමා සහිත අකරැල්ල තේ සහ රබර් සමාගම (ඒජන්තවරු, කොළඹ එයිට්කැන් ස්පැන්ස් සහ සමාගම | තේ වවා තිබෙන ඉඩම .. | 6 0 39 |
| X 32 | එම .. | එම .. | එම .. | 81 2 2 |
| Z 32 | එම .. | එම .. | එම .. | 11 0 14 |
| C 33 | දික්අරාවේගොඩ .. | එම .. | ලන්ද .. | 0 3 26 |
| D 33 | එම .. | එම .. | එම .. | 0 3 19 |
| E 33 | අකුරැල්ලවත්ත .. | එම .. | තේ වවා තිබෙන ඉඩම .. | 2 2 11 |
| F 33 | එම .. | එම .. | එම .. | 30 3 8 |
| I 33 | එම .. | එම .. | රබර් වවා තිබෙන ඉඩම .. | 50 3 26 |
| J 33 | එම .. | එම .. | තේ වවා තිබෙන ඉඩම .. | 63 2 5 |
| L 33 | එම .. | එම .. | රබර් වවා තිබෙන ඉඩම .. | 11 1 2 |
| M 33 | එම .. | එම .. | ලන්ද .. .. | 113 2 24 |
| Q 34 | එම .. | එම .. | වැව්ච්චකැලේ .. | 1 1 34 |
| R 34 | එම .. | එම .. | එම .. | 7 1 29 |
| S 34 | එම .. | එම .. | එම .. | 1 1 5 |
| T 34 | එම .. | එම .. | ලන්ද .. .. | 11 1 21 |
| V 34 | එගොඩඅරාවේගොඩ .. | එම .. | එම .. | 0 3 34 |
| X 34 | අකුරැල්ලවත්ත .. | එම .. | රබර් වවා තිබෙන ඉඩම .. | 18 1 14 |
| W 34 | එම .. | ආණ්ඩුව .. .. | මූකලාන .. | 6 3 1* |

* විකුණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 11වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්ශ.

# PRELIMINARY NOTICES, WASTE LAND SETTLEMENT.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[Kurunegala Notice No. 6,294.]

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 12වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කොටුවේ කන්තෝරුවේදී ඈන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු ඒ ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සනඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත් යුතුයි.

ඈන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ බස්නාහිර උඩුකහකෝරළේ දූලකනුන්ගේ යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටිය, ඒනම් :—

මුල් සිතියම 560.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 5 | ගම්සභාපාර | 0 3 19 |

මීට මායිම්—උතුරට අතුරුවල යන ගමේ ගම්ඉමද, ජයසිංහමුදලිගේ පීරිස්සිඤ්ඤෝ සහ සේතුනෝනා විසින් අයිතිකම් කියන බුළුගහමූලවත්තද ; නැගෙණහිරට ජයසිංහමුදලිගේ පීරිස්සිඤ්ඤෝ සහ සේතුනෝනා විසින් අයිතිකම්කියන බුළුගහමූලවත්තද, ජයසිංහමුදලිගේ මරතේලිස් අප්පුහාමි විසින් අයිතිකම්කියන කැටකෑලගහමූලවත්තද, ජයසිංහමුදලිගේ මරතේලිස් අප්පුහාමි විසින් අයිතිකම්කියන කැටකෑලගහමූලහේනද, අබේසිංහමුදියාන්සෙලාගේ රන්හාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන තල්ගහමූලපිල්ලෑවද, ජයසිංහමුදලිගේ දෙන් අගිලිස්අප්පු විසින් අයිතිකම්කියන අට්ටික්කාගහමූලවත්තද, හපුඅච්චි උඩුගම්පොලගේ නෝනාහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන මකුලගහමූලවත්තද, ජයසිංහමුදලිගේ මානිස්සිඤ්ඤෝ අප්පුහාමිගේ බලකාරයාවන ජේන්නෝනා විසින් අයිතිකම්කියන විලදගහමූලහේනද, හෙට්ටිගමගේ සින්ගප්පුහාමි විසින් අයිතිකම්කියන විලදගහමූලවත්තද, මන්නාවආරච්චිගේ හෙන්ද්‍රික් අප්පුහාමි විසින් අයිතිකම්කියන විලදගහමූලවත්තද, මිල්ලගස්පිටිය යන ගමේ ගම්ඉමද ; දකුණට මිල්ලගස්පිටිය යන ගමේ ගම්ඉමද ; බස්නාහිරට හාපිටිගම්කෝරළේ ලස්සපානේ පදිංචි අදිකාරිඅප්පුහාමිලාගේ අප්පුහාමි විසින් අයිතිකම්කියන කෝන්ගහමූලවත්තද, ජයසිංහමුදලිගේ අගිලිස් අප්පුහාමි විසින් අයිතිකම්කියන තලගහමූලපිල්ලෑවද, අබේසිංහමුදියාන්සෙලාගේ රන්හාමි සහ තවත් අය විසින් අයිතිකම් කියන තල්ගහමූලපිල්ලෑවද, ජයසිංහමුදලිගේ නෝනාහාමි විසින් අයිතිකම්කියන කෝන්ගහමූලපිල්ලෑවද, ජයසිංහමුදලිගේ පීරිස්සිඤ්ඤෝ සහ සේතුනෝනා විසින් අයිතිකම්කියන බුළුගහමූලවත්තද, අබේසිංහමුදියාන්සෙලාගේ රන්හාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන සේරුගහකුඹුරද, ජයසිංහමුදලිගේ පීරිස්සිඤ්ඤෝ සහ තවත් අය විසින් අයිතිකම්කියන කරදගහමූලවෙල්පිල්ලෑවද, තලහිටියගමගේ හරමානිස්ගේ බූදලේ බාරකාරීවන ලොකුපොලගමගේ රන්සෝහාමි විසින් අයිතිකම්කියන කදුරුගහමූලවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 506වෙනි පිටේ ප්ලෑනය බලනු.

[Kurunegala S. O. 133—1917.]

---

[Kurunegala Notice No. 6,295.]

වර්ෂ 1917ක්වූ අප්‍රේල් මස 12වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කොටුවේ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම ඉපන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ හිරියාලහත්පත්තුවේ මහගල්බොඩඑගොඩකෝරළේ මොරගොල්ල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටිය, එනම් :—

මුල් සිතියම 2,006.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| I 1009½ | මොරගහමූලවත්ත | 0 0 27 |

මීට මායිම්—උතුරට සහ නැගෙණහිරට රජසන්තක තිඹිරිකඩවෙලහින්නද ; දකුණට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක කරතිබෙන තිඹිරිකඩවෙලහේනගාවවත්තද ; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු මොරගහමූලහේනද (313,171 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩම).

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 506වෙනි පිටේ ප්ලෑනය බලනු.

[Kurunegala S. O. 134—1917.]

[Rules under "The Notaries Ordinance, 1907," relating to Deeds.]

නොයෙකශ්‍රීන් විරාජමානවූ මහා බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය නම් එක්සත් රාජ්‍යයෙහිද, මුහුදින් එතර ඇති ප්‍රදේශයන්හිද රාජපදප්‍රාප්ත සත්‍යාරක්ෂකවූ පස්වෙනි ජෝර්ජ් මහෝත්තමයාණන්වහන්සේගේ නාමයෙන්,

ශාන්ත මයිකෙල් සහ ශාන්ත ජෝර්ජ් නම් අති උත්තම පඞ්ක්තිවල නෛට් ග්‍රෑන්ඩ් ක්‍රෝස් නම් පදවියද බාත්නම් අති උත්තම පඞ්ක්තියේ නෛට් කොමැන්ඩර් නම් පදවියද, ලඞ්කාවීපයේ හා ඊට අයිති ප්‍රදේශවලද ආණ්ඩුකාර ධූරය හා සේනාධිපති ධූරයද උසුලන්නාවූ ගරුතර සර් ජෝන් ඇන්ඩර්සන් උතුමාණන්වහන්සේ විසින් දෙවාවදාරණලද

ප්‍ර කා ශ ස ත්‍ර ය යි.

**ජෝන් ඇන්ඩර්සන්.**

ලඞ්කාණ්ඩුකාරයන් වන අප විසින් වර්ෂ 1907තේ නොතාරිස් ආඥාපණතේ 30වෙනි කාණ්ඩයේ (1) වෙනි උප කාණ්ඩයෙන් අපට දීතිබෙන බලය කරණකොටගෙන කාරක මන්ත්‍රි සභාවේ අනුමතයද ඇතිව නොතාරිස් ධූරයේ කටයුතුකරණකල්හි අද්වකාත් හෝ පෙරකදෝරු නොවන නොතාරිස්වරුන්ගේ පිළිපැදීම පිණිස මෙහි පහත දක්වන නියෝග තනනලද බැවින්ද, එකී නියෝග එකී ආඥාපණතේ එකී කාණ්ඩයේ 2වෙනි උප කාණ්ඩයේ ප්‍රකාර නීතිදායක මන්ත්‍රණ සභාව ඉදිරිපිට තබනලද බැවින්ද එසේ තබා සතලිස් දවසක් ගතවූ පසුත් එකී මන්ත්‍රණ සභාව විසින් එකී නියෝග අමුතුකිරීමක් හෝ නිෂ්ප්‍රභාකිරීමක් නොකළ බැවින්ද, එකී නියෝග මෙහි දක්වන දිනේ පටන් වලංගුවන බව සියලුදෙනා විසින් දැනගත යුතුයි.

මෙසේ දෙවාවදාරන්ට යෙදුනේ අප ස්වාමීන්වහන්සේගේ වර්ෂ ප්‍රමාණයෙන් එක්වාදහස් නවසිය දහහතක්වූ මෙම පෙබ්‍රවාරි මස දසවෙනි දින එකී ලංකාවීපයේ කොළඹදීය.

ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
ආර්. ඊ. ස්ටබ්ස්,
මහලෙක්‍රතාරිස් වම්හ.

අප රජාණන් දෙවියෝ රකිත්වා.

---

එකී නියෝග.

35. (*i*) යම් නොතාරිස් කෙනෙකුගේ ඉදිරියේ ලියනලද හෝ සැබෑයි කියා පිළිගන්නාලද සෑම ඔප්පුතිරප්පු ලියවිලි ආදිය එම ලියනලද හෝ සැබෑයි කියා පිළිගන්නාලද තැන් පටන් හතලිස් අටපැයක් ඇතුළතදී සහතිකකරන්ට ඕනෑවා පමණකුත්නොව එම සහතිකකිරීමේ අත්සන සහ මුද්දර තැබීමද, එම කාලය තුළදීම කර නිමවන්ටත් ඕනෑය. එම කාලය ගණන් ගන්නාකල ඉරිදා දවස්ද, ආණ්ඩුවේ නිවාඩු දවස්ද අහක්කළ යුතුය.

35. (*j*) 23වෙනි නියෝගයේ 29වෙනි කාණ්ඩයේ ප්‍රකාර තබනලද ලේඛනයේ ඒ ඒ ඔප්පින්නවල තොරතුරු ඒ ඒ ඔප්පින්න ලියා නිමකළ වහාම ඇතුළත්කරන්ට ඕනෑවා පමණකුත්නොව එසේ ඇතුළත්කිරීම මොන කරුණක් නිසාවත් ලියාපුදට පසුවදා ඉරිදා දවසක් නොහොත් ප්‍රසිද්ධ නිවාඩු දවසක්වූයේවීනම් මිස පසුවදට වැඩියෙන් කල් ප්‍රමාදනොකළ යුතුය.

35. (*k*) එසේදයත් අසනීපයක් හේතුකොටගෙණ යම් නොතාරිස් කෙනෙකුට මෙම නියෝගවල් හෝ එයින් එකක් වත් පිළිපැදීම නුපුළුවන්වූයේවීනම් එම අසනීප භාවය වහාම ඔහු විසින් රාජකාරිකරණ පලාතේ ගම්බිම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැන වෙත වර්ෂ 1905හේ නොම්මර දෙක දරණ ආඥාපණත යටතේ රිජිස්තර්කරණලද වෛද්‍ය කෙනෙකුගේ සහතිකපත්‍රයක් ඇතුව දැනුම්දෙන්ට යෙදුනොත් මෙම නියෝගවල් කඩනොකළාක්මෙන් සලකනු ලැබේ.

H. M. RICHARDS, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.